# සත්බුදු වන්දනාව

සේනාසනාධිපති,
පිංවත් ලොකු ස්වාමීන් වහන්සේ
පූජ්‍ය බලන්ගොඩ සාසන මන්ත හිමි

2017 දෙසැම්බර් 31 වෙනිදා, 2018 වර්ෂයට සෙත් පතා, මාලේවන ආරණ්‍ය සේනාසන භූමියේදී පැවැත්වූ සත්බුදු මහා ආශිර්වාද පූජාවේ සංක්ෂිප්ත සටහන, මෙසේ සනිටුහන් කල වගයි.


**දායකවූයෝ** - සුනිල් ගමගේ මයා
රසිකා සඳමාලි මිය
ප්‍රදීප් ලසන්ත කුමාර මයා
anupurwaniwanmaga@gmail.com

**මුද්‍රණය** - දිමුතු මුද්‍රණාලය

අංක 103/A, නුවර පාර, යක්කල.
දුරː 033-2239662 / 077-8829705
0334366777 / 0766727070
විද්‍යුත් තැපෑලː dimuthupub@yahoo.com
දහම් පොත් කියවීම සඳහා පිවිසෙන්න.
වෙබ්ː www.dhammadanabooks.com

**සම්පාදක** - සේනාසනාධිපති,
පිංවත් ලොකු ස්වාමීන් වහන්සේ
පූජ්‍ය බලන්ගොඩ සාසන මන්ත හිමි

# පිදුම

අමරපුර සිරි සද්ධම්ම වංශ මහා නිකායේ මහා නායක අවසරයි, කරගොඩ උයන්ගොඩ මෛත්‍රී මූර්ති නායක හිමිට හා බෞද්ධ මධ්‍යස්ථානාධිපති, ශාසන සෝභන, සාම විනිසුරු, ඌව පළාතේ අධිකරන සංඝ නායක, අවසරයි. ගලගම විනීත දේව හිමිපානන්ට,

| | | |
|---|---|---|
| නමෝ තස්ස | - | මුනින්දස්ස |
| නමෝ දම්මස්ස | - | තස්සච |
| සංඝස්සපි | - | නමෝ තස්ස |
| තේසං තින්නං | - | නමෝ නමෝ /// |

## දූන් සියලු දෙනාම පෙහෙවස් සමාදන් වීමට පෙර සිල් ඉල්ලීමේ වාක්‍ය සජ්ජායනා කරන්න.

නමෝ තස්ස භගවතෝ
අරහතෝ සම්මා සම්බුද්ධස්ස ///

## සරණා ගමනය

බුද්ධං සරණං ගච්චාමි
ධම්මං සරණං ගච්චාමි
සංඝං සරණයි ගච්චාමි

දුතියම්පි බුද්ධං සරණං ගච්චාමි
දුතියම්පි ධම්මං සරණං ගච්චාමි
දුතියම්පි සංඝං සරණං ගච්චාමි

තතියම්පි බුද්ධං සරණං ගච්චාමි
තතියම්පි ධම්මං සරණං ගච්චාමි
තතියම්පි සංඝං සරණං ගච්චාමි

1. ජීවිතාන්තය දක්වා ඒ රහතන් වහන්සේලා පරපණ නැසීමෙන් වෙන්ව, පරපන නැසීම අත්හැර බහා තැබූ, ගල්, මුගුරු, දැල්, උගුල්, ආයුධ, ඇතිව පාපයට ලැජ්ජා ඇතිව, විපාකයට භිය ඇතිව, සියළු ප්‍රාණ භූථයින් කෙරෙහි හිතානුකම්පිව දයාවෙන්, කරුණාවෙන්, මෛත්‍රියෙන් යුතුව වාසය කරන්නේය. උන්වහන්සේලා අනුගමනය කරන මමද, මේ අධිෂ්ඨාන කරන කාලය තුල, පරපණ නැසීමෙන් වෙන්ව බහා තැබූ ගල්, මුගුරු, දැල්, උගුල්, ආයුධ, ඇතිව, පාපයට ලැජ්ජා ඇතිව, විපාකයට භය ඇතුව, සියළු ප්‍රාණ භූතයින් කෙරෙහි, හිතානු කම්පීව, දයාවෙන්, කරුණාවෙන් මෛත්‍රියෙන් යුතුව වාසය කරමි. මේ මාගේ පළමු ශික්ෂා පදයයි කියා හිතාගෙන, දේශනා කලාට පසු සජ්ජායනා කරමින් සමාදන් වෙන්න බලාපොරොත්තුවෙන් සාදු නාද දෙන්න.

**පාණාතිපාතා වේරමණී සික්ඛා පදං සමාදියාමි**

2. ජීවිතාන්තය තෙක් ඒ රහතන් වහන්සේලා නුදුන් දේ ගැනුමෙන් වෙන්ව, නුදුන් දේ ගැනුම අතහැර, දුන් දෙයක්ම ගන්නේ, දෙන දෙයක් ගැනීමට පමණක් බලාපොරොත්තු ඇතුව, පිරිසිදු වූ ආත්මපරිහරණයෙන් යුක්තව වාසය කරන්නේය. උන්වහන්සේලා අනුගමනය කරන මමද, නුදුන් දේ ගැනුමෙන් වෙන්ව, නුදුන් දේ ගැනුම අතහැර, දුන් දෙයක්ම ගන්නේ, දෙන දෙයක් ගැනීමට පමණක් බලාපොරොත්තු ඇතුව, පිරිසිදු වූ ආත්මපරිහරණයෙන් යුක්තව වාසය කරමි. මේ

මාගේ දෙවන ශික්ෂා පදයයි කියා සිහිකර ගෙන, දේශාන කලාට පසු සමාදන් වෙන්න. බලාපොරොත්තුවෙන් සාදු නාද දෙන්න.

## අදින්නාදාන වේරමණී සික්ඛා පදං සමාදියාමි

3. ජීවිතාන්තය තෙක් ඒ රහතන් වහන්සේලා අබ්‍රහ්ම චරියාවෙන් වෙන්ව, අබ්‍රහ්ම චරියාව අතහැර, බ්‍රහ්මචාරී වූයේ, හීනවූ, ග්‍රාම්‍ය වූ, නීච වූ, අසාර වූ, ආනර්‍ය්‍යය වූ, කාමයන්ගෙන් වෙන්ව, උතුම් වූ බ්‍රහ්මචාරී ගුණයෙන් වාසය කරන්නේය. උන්වහන්සේලා අනුගමනය කරන්නාවූ මමද මේ අධිෂ්ඨාන කරන්නාවූ කාලය තුල, අබ්‍රහ්ම චරියාවෙන් වෙන්ව, අබ්‍රහ්ම චරියාව අතහැර, බ්‍රහ්මචාරී වූයේ, හීනවූ, ග්‍රාම්‍ය වූ, නීච වූ, අසාර වූ, ආනර්‍ය්‍යය වූ, කාමයන්ගෙන් වෙන්ව, උතුම් වූ බ්‍රහ්මචාරී ගුණයෙන් වාසය කරමි. මේ මාගේ තුන්වන ශික්ෂා පදයයි කියා සිහිකර ගෙන, දේශනා කලාට පසු සමාදන් වෙන්න බලාපොරොත්තුවෙන් සාදු නාද දෙන්න.

## අබ්‍රහ්ම චරියා වේරමණී සික්ඛා පදං සමාදියාමි

4. ජීවිතාන්තය තෙක් ඒ රහතන් වහන්සේලා මුසා වාදයෙන් වෙන්ව, මුසා වාදය අතහැර, සත්‍යයෙන් සත්‍ය ගලපා, සත්‍ය වචන ඇතිව, සත්‍යවාදීව වාසය කරන්නේය. උන්වහන්සේලා අනුගමනය කරන මමද, මුසා වාදයෙන් වෙන්ව, මුසා වාදය අතහැර, සත්‍යයෙන් සත්‍ය ගලපා, සත්‍ය වචන ඇතිව, සත්‍යවාදීව වාසය කරමි. මේ මාගේ හතර

වන ශික්ෂා පදයයි කියා සිහිකර ගෙන, ස්වාමීන් වහන්සේ දේශනා කලායින් පසුව සජ්ජායනා කරමින් සමාදන් වෙන්න බලාපොරොත්තුවෙන් සාදු නාද දෙන්න.

**මුසාවාදා වේරමණී සික්ඛා පදං සමාදියාමි**

5. ජීවිතාන්තය තෙක් ඒ රහතන් වහන්සේලා මදයට හේතුවන, ප්‍රමාදයට හේතුවන, ලොව අල්ලා ගැනීමට හේතුවන යම් සුරාවක් ඇද්ද,යම් මේරයක් ඇද්ද, ඒ සුරාව මේරය ප්‍රමාදයෙන් වෙන්ව, සුරාව මේරය ප්‍රමාදය අතහැර නිවනට හිත පිහිටුවා වාසය කරන්නේය. ඒ රහතන් වහන්සේලා අනුගමනය කරන මමද, මේ අධිෂ්ඨාන කරන්නාවූ කාලය තුල, මදයට හේතුවන, ප්‍රමාදයට හේතවන, ලොව අල්ලාගැනීමට හේතුවන, යම් සුරාවක් යම් මේරයක් ඇද්ද, ඒ සුරාව, මේරය, ප්‍රමාදයෙන් වෙන්ව, සුරාව මේරය ප්‍රමාදය අතහැර නිවනට හිත පිහිටුවා වාසය කරමි. මේ මාගේ පස්වන ශික්ෂා පදයයි කියා සිහිකර ගෙන ස්වාමීන් වහන්සේ දේශනා කලායින් අනතුරුව සජ්ජායනා කරමින් සමාදන් වෙන්න. බලාපොරොත්තුවෙන් සාදු නාද දෙන්න.

**සුරා මේරය මජ්ජ පමා දට්ඨානා වේරමණී සික්ඛා පදං සමාදියාමි**

6. ජීවිතාන්තය තෙක් ඒ රහතන් වහන්සේලා විකාල භෝජනයෙන් වෙන්ව, විකාල භෝජනය අතහැර, කාලයට ගැලපෙන භෝජන පමණක් පරිභෝජනය

කරමින්, පස්වරු භෝජනයෙන් වැලකී වාසය කරන්නේය. උන්වහන්සේලා අනුගමනය කරන මමද, අධිෂ්ඨාන කරන්නා වූ කාලය තුල, විකාල භෝජනයෙන් වෙන්ව, විකාල භෝජනය අතහැර, කාලයට ගැලපෙන භෝජන පමණක් පරිභෝජනය කරමින්, පස්වරු භෝජනයෙන් වැලකී වාසය කරමි. මේ මාගේ හයවන ශික්ෂා පදයයි කියා සිහිකරගෙන, දේශනා කලාට පසු සමාදන් වෙන්න. බලාපොරොත්තුවෙන් සාදු නාද දෙන්න.

**විකාල භෝජනා වේරමණී සික්ඛා පදං සමාධියාමි**

**7.** ජීවිතාන්තය තෙක් ඒ රහතන් වහන්සේලා නැටුම්, ගැයුම්, වැයුම්, උසුළු, විසුළු, මල් මාලා, සුවද විලවුන්, දැරීමෙන් ගැල්වීමෙන් පැළදීමෙන් වැලකී මේ සියල්ලෙන්ම වෙන්වී, අල්පේච්ඡව වාසය කරන්නේය. උන්වහන්සේලා අනුගමනය කරන මමද, මේ අධිෂ්ඨාන කරන කාලය තුල, නැටුම්, ගැයුම් වැයුම්, උසුළුවිසුළු, මල්මාලා, සුවද විලවුන්, දැරීමෙන් ගැල්වීමෙන් පැළදීමෙන් වැළකී මේ සියල්ලෙන්ම වෙන්වී, අල්පෙච්ඡව වාසය කරමි. මේ මාගේ හත්වන ශික්ෂා පදයයි කියා සිහිකර ගෙන, ස්වාමීන් වහන්සේ දේශනා කල පසුව සමාදන් වෙන්න බලාපොරොත්තුවෙන් සාදු නාද දෙන්න.

**නච්ච ගීත වාදිත විසූක දස්සන මාලාගන්ධ විලේපන ධාරන මන්ඩන විභූසනට්ඨාණා වේරමණී සික්ඛා පදං සමාදියාමි**

8. ජීවිතාන්තය තෙක් ඒ රහතන් වහන්සේලා උච්ජාසයන මහාසයනයෙන් වෙන්වී, උච්ජාසයන මහාසයන අතහැර නිහතමානී වූයේ මැස්සක්, තණ ඇතිරියක්, පත්කඩක්, ඇසුරු කරමින් වාසය කරන්නේය. උන්වහන්සේලා අනුගමනය කරන මමද, උච්ජාසයන මහාසයනයෙන් වෙන්වී, උච්ජා සයන මහාසයන අතහැර නිහතමානී වූයේ, මැස්සක්, තණ ඇතිරියක් පත්කඩක් ඇසුරු කරමින් වාසය කරමි. මේ මාගේ අටවන ශික්ෂා පදයයි කියා සිහි කරගෙන, ස්වාමීන් වහන්සේ දේශනා කල පසුව සමාදන් වෙන්න බලාපොරොත්තුවෙන් සාදු නාද දෙන්න.

**උච්ජාසයන මහාසයනා වේරමණී සික්ඛා පදං සමාදියාමි**

9. අටවැනි ශික්ෂාවට නව වැන්නක් එකතු කිරීම මහත් ඵලයි, මහානිසංසයි කියා බුදුරජාණන් වහන්සේ විසින්ම දේශනා කොට වදාළා. නවාංග උපෝසථ සූත්‍රය තුලින් ඒ බව වදාලා. ජීවිතාන්තය තෙක් ඒ රහතන් වහන්සේලා දස දිශාවටම මෙත් සිත පතුරවමින්, අනන්ත සක්වල වාසී සියළුම සත්වයන්ට මෛත්‍රී චේතෝ විමුක්තිය පතුරුවාලමින් වාසය කරන්නේය. ඒ රහතන් වහන්සේලා අනුගමනය කරන්නාවූ මමද, සියලු ලෝක සත්වගීයන්ටම මෙත් සිත පතුරුවාලමින් මේ ආරාමය තුල වාසය කරමි. මේ මාගේ නවවැනි ශික්ෂා පදයයි කියා සිහිකරගෙන ස්වාමීන් වහන්සේ දේශනා කල පසුව සමාදන් වෙන්න බලාපොරොත්තුවෙන් සාදු නාද දෙන්න.

## මෙත්තේන චිත්තේන විහාරානී.

නවාංග උපෝසථ ශීලානි සමාදියාමි .../// 

තිසරණේන සද්ධිං නවාංග උපෝසථ සීලං

ධම්මං සාධුකං සුරක්ඛිතං කත්වා

අප්පමාදේන සම්පාදේ තබ්බං.

## ක්ෂීර පායාස පූජාව

1. මාගේ ස්වාමී වූ
   බුදු රජාණන් වහන්සේලාගේ
   බුදුගුණ අනන්තයි .......... ///

   අනන්ත වූ බුදුගුණ බලයෙන්
   සියළු බාධක දුරුවේවා
   දහම් නැණ පහල වේවා
   මග ඵල නිවන් අවබෝධ වේවා .......... ///

2. මාගේ ධර්ම ස්වාමී වූ
   බුදුරජාණන් වහන්සේලා
   දේශනා කොට වදාළා වූ
   සද්ධර්ම රත්නයේද
   දම්ගුණ අනන්තයි .......... ///

අනන්ත වූ දම්ගුණ බලයෙන්
සියළු බාධක දුරුවේවා
දහම් නැන පහල වේවා
මග ඵල නිවන් අවබෝධ වේවා .......... ///

3. මාගේ ස්වාමී වූ
බුදුරජාණන් වහන්සේලාගේ
දෙපස වැඩ සිටියා වූ
මහා සඟ රුවනගෙද
සඟ ගුණ අනන්තයි .......... ///

අනන්ත වූ සඟගුණ බලයෙන්
සියළු බාධක දුරුවේවා
දහම් නැන පහල වේවා
මග ඵල නිවන් අවබෝධ වේවා .......... ///

4. මාගේ ස්වාමී වූ
බුදුරජාණන් වහන්සේලා
සේවනය කරන ලද්දා වූ
බෝධි රාජයාණන් වහන්සේලාගේ
ශක්තිය අනන්තයි .......... ///

ඒ කිරණ ශක්තියේ බලයෙන්
සියළු බාධක දුරුවේවා
දහම් නැන පහල වේවා
මග ඵල නිවන් අවබෝධ වේවා .......... ///

# සත්බුදු ගුණ

සත්බුදු බලෙන් සවනක් රැස් විහිදේවා
මුළු සක්වලම අලෝකය පැතිරේවා
මේ මහ කුසල් ගඟ දස අතටම යාවා
දස දහසක් ලොවේ පිංකෙත් ඉතිරේවා

සැම ලෝසතට මේ මහ කුසලය වේවා
මෙත් කරුණා බලෙන් අනුමෝදන් වේවා
කලගුණ දන්න අය ලෝකෙම වැඩි වේවා
එමගින් සුගතියද නිවනද හිමි වේවා

සත්බුදු රජාණන් වැඩි ලෙස සිතාගෙන
සත්බුදු රජුන්ගේ ගුණ කඳ මවාගෙන
සත්බුදු රජුන් දෙසූ බන පද අසාගෙන
සත්බුදු පිලිසරණ ලැබ ගමු ගුනේ දූන

දෙතිසක් මහ පුරුෂ ලකුණුද සිහි කරමු
ශ්‍රී පද ලාංඡන සක් ලකුණුද දකිමු
ෂඩ් වර්ණයෙන් මංගල ලකුණුද සිතමු
ඒ මහ මුනි රජුන්ගේ ගුණයට වඳිමු

සත්බුදු මැදුරු තම හදවත කර ගන්න
බුදු මැදුරක් ලෙසට තම හිත රැක ගන්න
සුදු බුදු මැදුර තුල සත්බුදු වැඩ ඉන්න
මෙත් කරුණා සිසිල් දහරට එක් වන්න

සත්බුදු බලෙන් සඳහම් මඟ දිලේවා
සඳහම් බලෙන් සිල් ගුණයට හැරේවා
මහ සඟ රුවන මේ මළුවට වඩීවා
මේ මහ කුසලයෙන් නිවනම ලැබේවා

සැමගේ එකමුතුව තුල පිංකම වූවා
සැමගේ උපකාර අත හිත ගෙන පෑවා
තිස් තුන් කෝටියක් දෙවියන් මෙහි ආවා
සැමටම බුදු සසුනෙ අම නිවනම වේවා

සසරින් මිදෙන්නට බොහෝ අය වෙහෙසෙනවා
දුක් පීඩා නිතර කරදර ගෙන එනවා
අපටත් හොරෙන් බුදු සසුනින් විසිවෙනවා
අධිපති මාර බලයට සැම යටවෙනවා

සියළුම දෙනා උපකාරය ලැබ දුන්න
ප්‍රති උපකාරයට සද්ධර්මය දුන්න
මේ මහ කුසලයෙන් අනුමෝදන් වෙන්න
ගෞතම බුදු සසුනෙ නිවනින් සැනසෙන්න

ස්වයංජාත ලෙස බෝධිය හට ගන්නේ
ධර්මතාවයක් ලෙස එය සිදු වන්නේ
සියළුම බුදුරදුන් එලෙසයි බුදු වන්නේ
සත්බුදු බුදු රදුන් වැදුමට සැර සෙන්නේ

ගල් ලෙන් මාලිගා වල නැහැ බුදු වන්නේ
සහජාතයෙන් මහපොලවෙන් නැග එන්නේ
දෙවියන් බඹුන් මේ වෘක්ෂය රැක ගන්නේ
සම්බුදු සසුන පවතින තුරු පුද දෙන්නේ

අට්ඨ ඵල දෙතිස් ඵල ලෙස පැතිරෙන්නේ
තුන්ලෝ සතට සහනය සෙත සැලසෙන්නේ
බෝධියේ නමට පුජාවෙන් පුද දෙන්නේ
විහිදෙන කිරණයට ලෝසත සැනසෙන්නේ

සතියක් නෙත් යොමා පූජාවක් කරලා
හිම්බුදු රජුන් පළමුව බෝධිය පුදලා
කලගුණ සැලකීම ලෝකෙට මතු කරලා
ආදර්ශය උතුම් නුවණින් ගනු හිතලා

තුන්ලෝ තිලක අප සම්බුදු රජාණනී
තුන්ලෝ සතට සෙත සැලසූ පියාණනී
අටලෝ දහම බෙදුවේ නිති දයාවෙනී
තුන්ලෝ සතුන් අම නිවනට ලගාවුනී

වසරක් ගෙවී නව වසරක් ලබන්නේ
සම්බුදු මුවින් දෙසූ දහමයි බෙදන්නේ
නුවනැති පිනැති අයටයි මේ කියන්නේ
බිහිසුණු සසර තරණය කර දිනන්නේ

අසරණ ලෝ සතුන් වෙත යොමුකර කරුණා
මහ අනතුරක් ඉදිරියෙ ඇති බව පෙන්නා
පතල මහා කරුණාවෙන් මග පෙන්නා
දුර්ලභ බුදු සසුන අපටත් හිමි වෙන්නා

සත්බුදු ගුණ කඳට උපහාර පුදමු
සත්බුදු රජුන් පෙලටම පූජා තබමු
සත්බුදු ගුණ ගයා ගාථාවෙන් කියමු
සත්බුදු රජාණන් ගෞරවයෙන් වදිමු

"විපස්සිස්ස නමත්තු - චක්ඛු මන්තස්ස සිරීමතෝ
සඛිස්සසි නමත්තු - සබ්බ භූතානු කම්පිනෝ
වෙස්සභූස්ස නමත්තු - නහාතකස්ස තපස්සිනෝ
කකුසන්දස්ස නමත්තු - මාරසේන පමද්දිනෝ
කෝනාගමනස්ස නමන්තු - බ්‍රහ්මනස්ස වුසීමතෝ
කස්ස පස්ස නමත්තු - විප්ප මුත්තස්ස සබ්බදී
අංගීරසස්ස නමත්තු - සක්‍යපුත්තස්ස සිරීමතෝ

යෝ ඉමං ධම්ම මදේසේසී
සබ්බ දුක්ඛා පනුදනං
යේ වාපි නිබ්බුතා ලෝකේ
යථාභූතං විපස්සිසුං
තේ ජනා අපිසුනා
මහන්තා වීතසාරදා
හිතං දේව මනුස්සානං
යං නමස්සන්ති ගෝතමං
විජ්ජා චරන සම්පන්නං
මහන්තං වීතසාරදං"

සත්බුදු රජුන්ගේ බුදුරුව මවාගෙන
සත්බුදු රජුන්ගේ බුදුගුණ ගයාගෙන
සත්බුදු රජුන්ගේ බුදුබණ අසාගෙන
ගෞතම සසුනේ සැනසෙමු ගිනි නිවාගෙන

අලංකාර ලෙස බෝ මළුවෙක් හඳමු
ෂඩ් වර්ණයට මාලා පූජා කරමු
ගිලන්පස සුවද මල් පහනින් පුදමු
සත් බුදු රජුන් බුදු මැදුරට වඩම වමු

ආලෝකයෙන් සත්බුදු රජ පිදේවා
සුවදින් මුළු ලොවම දස අත පිරේවා
නානා විධ මලින් සත්බුදු පිදේවා
අනුකම්පා හිතින් ඉවසා දරාවා

කප් රුක් ධජ වලින් බුදුරුස් නැගේවා
මධුරින් චතුමධුර ඔසු පැන් පිදේවා
සත්බුදු ගුණ කඳට උපහර පිදේවා
සත්බුදු බලෙන් නිවනට මග සැදේවා

සුදු බුදු මැදුරු සුදු නෙලුමින් සරසන්නේ
බැති සිත් උපදවා සම්දුට පුද දෙන්නේ
සත්බුදු ගුණ බලෙන් දුක්ගිනි නිම වන්නේ
බියකරු සසර සැඩ පහරයි දිනන්නේ

මේ සැරසෙන්නේ බුදු සිරිපා නමදින්නයි
සිරිපා කමල් සුදු නෙලුමින් සරසන්නයි
අටපිරිකර බෙහෙත් පූජා කරන්නටයි
අට මහා කුසලයෙන් නිවනම ලබන්නමයි

සම්බුදු පහල වීමෙන් ලොව බබලනවා
ආනන්තරික ලෝකෙට රැස් විහිදෙනවා
සතර අපායද මොහොතක් සුවදෙනවා
දෙවි මහ බඹුන් මිනිසුන් නිවනට යනවා

මිහිදිටු වලින් වැහිලයි ලෝ සත ඉන්නේ
ඉපදෙන මැරෙන සසරේ දුක නැහැ දන්නේ
සම්මත වැඩ ටිකට පමනයි දැඟ ලන්නේ
තුන්ලොව නැති සැපක් සොයමින් දිව යන්නේ

අති දුර්ලභ ලෙසයි මිනිසත් බව ලැබුවේ
බුදුබන හිතන්නට නුවණක් නැත ඔලුවේ
බුදු සසුනක් ලබන්නට මයි පිං කෙරුවේ
බොරුවෙන් මුලාවෙන් කවුරුද සිත වැහුවේ

අවිදුව තණ්හාව තුරුලේ තබාගෙන
ලෝකය අල්ලන්න සිතුවිලි මවාගෙන
වීදුරු මාලිගා අහසේ හදාගෙන
දුක පොදි බැදන් කොහෙ යන්නද අඩාගෙන

සිවුහස් දහම ඇති සැටියෙන් දැක ගන්න
සම්බුදු පහල වෙන්නේ සත මුදවන්න
තෙරුවන් නිවැරදිව හඳුනා ගෙන ඉන්න
හැකිවෙයි ඔබට සුගතිය නිවනට යන්න

අද ගොළු බිහිරි කෙලතොලු බව නොවන්නේ
අති දුර්ලභව මිනිහත් බව ලබන්නේ
කල්ප ගනනකින් සසුනක් ලැබන්නේ
සසරින් මිදෙන්නට මේ ඇති හිතන්නේ

සම්බුදු අසිරියෙන් ලෝකය බබලන්නේ
මිසදිටු දනන්ගේ ලෝකය දියවන්නේ
දුර්ලභ ලාභයකි ලෝකයටම වෙන්නේ
නුවනැති පිනැති දෙව් මිනිසුන් සැනසෙන්නේ

බුදු මග යන සතට තතු වැටහී යාවා
දුර කතරක් ගෙවා ගෙන මුත් මෙහි අවා
මහ දෙව් බඹු පිරිස් සත්බුදු හිමි ගාවා
සම්බුදු අසිරියෙන් සැම සුවපත් වේවා

# බෝධි වන්දනාව

බුද්ධ  පච්චේක බුද්ධ - අග්‍රශ්‍රාවක - මහා ශ්‍රාවක - චක්‍ර වර්තී රාජාදී - මහෝත්තමයන් පහල වන්නා වූ - ශ්‍රීමත් ජම්බු දීපයේ - මධ්‍ය දේශයේ - මගධ උරුවේලා දනව්වේ - නේරංජා නදී තීරයේ - සියළු බුදුවරයන් බුදුවන - උත්තම භූමි භාගයේ - සිදුහත් කුමාරයාණෝ - මව් කුසින් බිහිවීමත් සමගම - පැන නැන්ගාවූද - බෝධි සත්වයන් වහන්සේ - දස මරුන් පරදවා - උතුම් වූ බුදු බවට - පත් වී වදාලා වූද - බුදුරජාණන් වහන්සේ - සතියක් මුළුල්ලෙහි - එහිම වැඩ හිඳ - සේවනය කරන ලද්දාවූ - අනිමිස ලෝචන නම්වූ - නේත්‍ර පූජාාවෙන්ද - පිදුම් ලැබුවාවූ - පරම පූජනීය වූ - බෝධි රාජයානන් වහන්සේට - සත්බුදු රජානන් වහන්සේලාට - අප විසින් තැන්පත් කලා වූ - මේ සියලුම පූජාවෝ - ආදර ගෞරවයෙන් - සාදර භක්තියෙන්

පූජා කරමි...පූජා වේවා...
පූජා කරමි...පූජා වේවා...
පූජා කරමි...පූජා වේවා...



# පැන්

සත්බුදු රජුන්ගේ අපමන ගුණ දකිමු
සත්බුදු රජුන් ඉදිරියෙ පූජා තබමු
සත්බුදු රජුන් දෙසූ බන පද සිහි කරමු
සත්බුදු දම් කඳට සිසිලැති පැන් පුදමු

අමා දම් දහර දිය කඳ ගලන්නේ
නුවනැති දනන් සඳහම් ගඟ දකින්නේ
මුනි සඳහම් දියෙන් ගත සිත නිවෙන්නේ
උපහාරය ලෙසට මේ පැන් පුදන්නේ

ගිනිගත් ලෝ සතුන් අම දහරින් නාවා
සහනය සතුට සැනසුම සුවසෙත පෑවා
සඳහම් ගඟ ගලා ලොව සුවපත් වූවා
සත්බුදු ගුණ කඳට පැන් පූජා වේවා

සිසිලැති පැන් බඳුන් සත්බුදු ලඟ තබමු
සැඳැහැති සිතින් බුදු බන සිහිකර ගනිමු
හැමදෙන එක්ව සත්බුදු රුව දක ගනිමු
ගාථා නද දෙමින් පැන් පූජා කරමු

අධිවාසේ තුනෝ භන්තේ - පානීයං පරි කප්පිතං
අනුකම්පං උපාදාය - පතිගං හාතුමුත්තමං

සේවිතං ධම්ම රාජේන
පත්තුං සම්බෝධි මුක්තමං
පූජේමි බෝධි රාජානං
උදකේනේකේන සාදරං

# ගිලන් පස

මහ කරුණා ගුණෙන් ලෝකය බලන්නේ
මෙත් කරුණා දියෙන් ලොසත තෙමෙන්නේ
දුක් කම්කටොලු බාදක මග හැරෙන්නේ
සදා සැනසුමට මංපෙත ඇරෙන්නේ

සත්බුදු රජුන් වෙත ඔසු පැන් පිදේවා
බාධක මග හැරී බුදු මග පෙනේවා
ලෙඩ දුක් රෝග පීඩාවන් නොවේවා
ඔසු පැන් පූජාවෙ අනුහස් ලැබේවා

සත්බුදු රජුන් හමුවට අද අපි ආවා
ගිලන්පස ලෙසින් ඔසු පැන්ගෙන ආවා
සත්බුදු අසුනෙ පිළිවෙලටම ගෙන පැවා
නිවනම ලැබේවා මෙය පූජා වේවා

සංවර සිතින් පූජාවන් ගෙන තබමු
සත්බුදු රජුන් පිළිවෙලට දැන් තබමු
සාදු නාදයෙන් සත්බුදු පිළි ගනිමු
ගාථා නද දෙමින් දැන් පූජා කරමු

අධිවාසේ තුනෝ භන්තේ
ගිලාන පච්චයං ඉමං
අනුකම්පං උපාදාය
පතිගං හාතු මුත්තමං

සේවිතං ධම්ම රාජේන
පත්තුං සම්බෝධි මුත්මං
පූජේමි බෝධි රාජානං
භේසජ්ජං සාදු පූජිතං

# අර්ඝපාන

මධුර ලෙස පානයක් පිළියෙල කරලා
සද්ධා භක්තියෙන් පුජාවක් හදලා
සත්බුදු රජානන් හමුවට වඩම වලා
සුමදුර දම් කදට මෙය පූජා කරලා

තුන්ලෝ සතට දම් දිය කඳ ගලන්නේ
මිසදිටු බැහැර වී ලෝකය දිලෙන්නේ
සඳහම් වැස්ස අම නිවනයි ගෙනෙන්නේ
බුදු දම් සගුන් පමනයි සෙත සදන්නේ

අට පැන් බඳුන් සත්බුදු අසුනේ තබමු
දෙව් බඹු එක්ව දැන් පූජාවන් තබමු
බුදුපිය මුල්ව මහ සඟරුවනද වඳිමු
ගාථා නද දෙමින් දැන් පූජා කරමු

අධිවාසේ තුනෝ භන්තේ
අර්ඝ පානං උපානාමිතං
අනුකම්පං උපාදාය
පතිගං හාතු මුත්තමං

සේවිතං ධම්ම රාජේන
පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං
අර්ඝ පානං සාදු පූජිතං

# චතු මධුර

සිවුසස් දහම ලෝකය තුල පතුරන්නේ
චතු සත්‍යය ලොවට දෙන්නයි බුදු වන්නේ
සත්බුදු රජුන් වැඩි මාවත මෙය වෙන්නේ
අවබෝධය තුලින් නිවනට බැස ගන්නේ

නිත්‍යයි සැපයි කියමින් ලෝසත ඉන්නේ
සම්බුදු පහල වීමක් ගැන නොම දන්නේ
සද්ධර්මය පවා මනසට නැහැ යන්නේ
දුෂ්ඨක්ෂණ වලින් මිදිලත් පර දින්නේ

බෝධි මුලයෙදි මේ ඉරණම පෙනුනා
පවින් ගොඩ ගන්න බැරි අය ලොව සිටිනා
දෙව්දත් චුන්ද කෝකාලික ලග සිටිනා
තෙරුවන් නොදක භියකරු සසරට වැටුනා

සිවුහස් දහම තුල අවබෝධය ලබමු
සතර අපා දොරවල් සදහට වහමු
චතු මධුරක් ලෙසින් ආසන මත තබමු
ගාථා නද දෙමින් දන් පූජා කරමු

අධිවාසේ තුගෝ හන්තේ
චතු මධුරං පරි කප්පිතං
අනුකම්පං උපාදාය
පතිගං හාතු මුත්තමං

සේවිතං ධම්ම රාජේන
පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජාතං
චතු මධුරං සාදු පූජිතං

# දැහැත්

සත්බුදු රජුන්ගේ අසිරිය අපමනය
සත්බුදු රජුන්ගේ ගුණ කද අපමනය
සත්බුදු රජුන්ගේ සඳහම් අපමනය
සත්බුදු දම් සගුන් තුන් ලොවටම බලය

ශ්‍රී මුඛ දේශනාවයි ලොව බැබලෙන්නේ
දෙවියන් බඹුන් මිනිසුන් නිති පුද දෙන්නේ
දුක් ගිනි කඳ නිවා ලෝසත සැනසෙන්නේ
සත්බුදු පුදන්නට දැහැතින් සැරසෙන්නේ

සත්බුදු පිරිනිවී බොහො කල් ගත වෙන්නේ
සුගතියෙ දෙව්බඹුන් හට මොහොතකි වන්නේ
මිනිසුන්ටත් වඩා සඳහම් වැටහෙන්නේ
පිං ඇති දෙව් බඹුන් පූජාවට එන්නේ

සැදැහැතියෙන් දැහැත් පූජාවක් හදමු
බුලත් හුනු පුවක් සුවඳැති සෑම තබමු
සත්බුදු රජුන් පිළිවෙලටම වඩව වමු
ගාථා නද දෙමින් දැන් පූජා කරමු

අධිවාසේ තුනෝ භන්තේ
තාම්බුළං උපනාමිතං
අනුකම්පං උපාදාය
පතිගං හාතු මුත්තමං

සේවිතං ධම්ම රාජේන
පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං
තාම්බූලං උපනාමිතං

# මල්

නානා විධ මිලින් සත්බුදු    හිමිගාවා
සුවඳැති මලින් යුග සිරිපා    සැරසූවා
මේ මල් පරව යන බවමට    සිහිවූවා
පිදු මල් වලින් අවබෝධය මට    ආවා

ලස්සන සුවඳ කුසුමන් සත්බුදු    ගාවා
හේතුව ඵලය දකිමින් මේ මල්    පිදුවා
වැහැරෙන කයේ උරුමය නිති    සිහිවූවා
මැලවී පරව යන මල වෙමි    හිමිගාවා

සඳහම් අරුත දකලයි මම මල්    නෙලුවේ
ආමිසයට නොවේ නිවනට මඟ    දුටුවේ
මී මැසි බඹර කැල රොන් පැණි ඇද    බැලුවේ
පරවුණු මලට මේ කිසිවෙකු නොම    ආවේ

සම්බුදු දහමෙ අර්ථය මලකින්    දකිමු
මල් වගේ කියක කය වැහැරෙන හැටි    සිතමු
සැනසුම් සුව සොයා සත්බුදු හිමි    වදිමු
ගාථා නද දෙමින් මල් පූජා    කරමු

වණ්ණ ගන්ධ ගුනෝ පේතං
ඒතං කුසුම සංතතිං
පූජයාමි මුනින් දස්ස
සිරීපාද සරෝරුහේ

පූජේමි බුද්ධං කුසුමේන නේන
පුඤ්ඤේන මේතේන ලබාමි මොක්ඛං
පුප්පං මිලායාති යාථා ඉදම්මේ
කායෝ තතායාති විනාස භාවං

සේවිතං ධම්ම රාජේන
පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජාණන්
පුප්පේ නේත්තේන සාදරං

## සුවඳ

සිල් සුවදට වඩා සුවදක් ලොවේ නැත
මනරම් සිල් සුවඳ එතරම් වටිනු ඇත
දස අත විසිර යන්නට ඉඩ හසර ඇත
දෙවියන් බඹුන් සිල් සුවඳට වඳිනු ඇත

දැවි දැවී යන කුර දෙස සිත යොමා ගෙන
දින දින ගෙවි ගෙවී මරණය ලගා වෙන
සත්බුදු හිමිනමට සුවඳැති කුරු ගෙන
මෙය පිදුවේ දහම් අර්ථය සොයා ගෙන

එකොලොස් ගින්නකින් ලෝ සත දැවෙන්නේ
ගිනි නිවෙනා බවක් නම් නැත පෙනෙන්නේ
සුවඳ කුරකින් මේ ගැන සිතන්නේ
නිවනට යන මඟයි කුරෙන් කියන්නේ

ගිනි ගෙන දැවෙන කුරට උපමා කරමු
හිතගිනි ගත් ලෙසින් සඳහම් ඇස් ලබමු
සීලය සුවඳ කර සත්බුදු හිමි පුදමු
ගාථා නද දෙමින් දැන් පූජා කරමු

සුගන්ධිකාය වදනං - අනන්ත ගුණ ගන්ධිනා
සුගන්ධිනාහං ගන්දේන - පූජයාමී තථාගතං

ගන්ධ සම්බාර යුත්තේන
ධූපේනාහං සුගංධිනා
පූජයේ පූජනීයං තං
පූජා භාජන මුත්තමං

සේවිතං ධම්ම රාජේන
පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං
ධූපේ නේත්තේන සාදරං

## පහන්

තිරයද තෙල්ද පහනින් උපමා කරලා
දැල්ලද සමඟ මේ සේරම මුහු කරලා
හේතුව ඵලය දහමින් නිති මතු කරලා
නුවනැති පිනැති අය සිරි සඳහම් දැකලා

මාලා රශ්මි ලෙස සකසා පුදන්නේ
සුදු බුදු මැඳුරු තනවා පුද කරන්නේ
සත්බුදු රදුන්ටයි පූජා කරන්නේ
පුඤ්ඤා ඇසට උපහාරය පුදන්නේ

හිරු සඳු ලෙසට ලොව බැබලූ පියාණනී
ෂඩ් වර්ණයෙන් රැස් විහිදුනු පියාණනී
සද්ධර්මය තුන්ලොවටම බෙදා දුනී
පහනේ අරුත දැක සැනසෙමි පියාණනී

අවිදු අඳුරු බිඳ සඳහම් ඇස ලබමු
හේතුව ඵලය දැන දැක සසරින් මිදෙමු
සත්බුදු පිළිවෙලින් අලෝකය පුදමු
ගාථා නද දෙමින් දැන් පූජා කරමු

සනසාරප්ප දිත්තේන
දීපේන තමදන් සිනා
තිලෝක දීපං සම්බුද්ධං
පූජයාමි තමෝනුදං

සේවිතං ධම්ම රාජේන
පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං
දීපේනේත්තේන සාදරං

## කොඩි

| | |
|---|---|
| කොඩිවැල් දිලෙන ලෙස සඳහම් | බැබලේවා |
| කප්රුක් ලෙසින් හිතු පැතුමන් | ඉටුවේවා |
| සසරින් මිදෙන අරි අට මග | වැටහේවා |
| ගෞතම බුදු සසුනෙ නිවනම | හිමිවේවා |
| | |
| සම්දුන් ජීවමානව වැඩ | සිටින්නේ |
| අප ඉදිරියේ සත් බුදු වැඩ | සිටින්නේ |
| සේක බල පංච ඉන්ද්‍රිය | වැඩෙන්නේ |
| හඳ පිරි සතුටිනුයි කොඩි වැල් | අඳින්නේ |
| | |
| සත්බුදු අසිරියට කොඩි වැල් ලෙල | දෙනවා |
| සත් බුදු ගුණ කඳට උපහාරය | වෙනවා |
| කප්රුක් වලින් බෝ සම්දුන් පුද | දෙනවා |
| සසරින් මිදෙන්නට අපි සැම | සැරසෙනවා |
| | |
| සත්බුදු රජුන් හමුවේ කොඩි වැල් | අඳිමු |
| ඇසතු බෝධියට උපහාරය | පුදමු |
| සංවර සිතින් සත් බුදු සම්දුන් | වඳිමු |
| ගාථා නද දෙමින් කොඩි පූජා | කරමු |

අධිවාසේ තුනෝ භන්තේ
ධජේනේත්තේන සාදරං
අනුකම්පං උපාදාය
පතිගං හාතු මුත්තමං

සේවිතං ධම්ම රාජේන
පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං
ධජේනේත්තේන සාදරං
කප්රුක් පූජාය සාදරං

## අටපිරිකර

| | |
|---|---|
| සත්බුදු රජුනි අපි අට පිරිකර | පිදුවා |
| අටමහ කුසලයට හිමි කුසලය | ලැබුවා |
| ගරු කාර බඹු අට පිරිකර | පිදුවා |
| ගෞතම බුදු සසුන තුල නිවනම | පැතුවා |
| | |
| බාධක ලිහිල් වී කරදර | අඩුවේවා |
| සහනය සතුට තුල සඳහම් | වැටහේවා |
| චීවරයක් දරන්නට පිං මතු | වේවා |
| මේ බුදු සසුන තුල නිවනින් | සැනසේවා |
| | |
| ඉපදෙන මැරෙන සසරේ තතු | වැටහේවා |
| සතර අපා දුක් සඳහට | නිමවේවා |
| බුදු සසුනේ මැදුම් පිලිවෙත | හමුවේවා |
| ජරා මරණ දුක් ගිනි කඳ | නිමවේවා |

සත් බුදු රජුන්ගෙන් අවසර ලැබගනිමු
පැතුමන් සිහි තබා අටපිරිකර පුදමු
සත්බුදු රදුන් අප ඉදිරියෙ යැයි සිතමු
ගාථා නද දෙමින් අටපිරිකර පුදමු

අධිවාසේ තුනෝ භන්තේ
අට්ඨ පරික්කාරං උපනාමිතං
අනුකම්පං උපාදාය
පතිගං හාතු මුත්තමං

සේවිතං ධම්ම රාජේන
පත්තුං සම්බෝධි මුත්තමං
පූජේමි බෝධි රාජානං
අට්ඨ පරික්කාරං සාදු පූජිතං

# සත්සති වන්දනා

පඨමං බෝධි පල්ලංකං
දුතියං ච අනිමිමිසං
තතියං චංක මනං සෙට්ඨං
චතුත්ථං රතනාගරං
පංචමං අජපාලංච
මුචලින්දේන ජට්ඨමං
සත්ථමං රාජායතනං
වන්දේ තං මුනි සේවිතං

# ආශිර්වාද පූජාව

යස්ස මූලේ නිසින්නෝව
සබ්බාරි විජයං අකා
පත්තෝ සබ්බං ඤුතං සත්ථා
වන්දේ තං බෝධි මුත්තමං

යස්ස මූලේ මහා සත්තෝ
ජෙත්වා මාරං මහබ්බලං
පත්තෝ සබ්බං ඤුතං සත්ථා
වන්දේ තං බෝධි මුක්තමං

යස්ස මූලේ නිසී දිත්වා
සත්ථාහං ලෝක නායකෝ
විමුක්ති සුඛ සංවේදී
වන්දේ තං බෝධි මුක්තමං

යස්ස පූජේහි සම්බුද්ධෝ
සත්ථාහං සක ලෝචනේ
පූජිතං නර දේවේනී
වන්දේ තං බෝධි මුක්තමං

ආයුං ආරෝගතං වන්නං
යසං කිත්තිං ධනං බලං
වඩ්ඩෙන්තං පූජයන්තානං
වන්දේ තං බෝධි මුක්තමං

දුක්ඛං රෝගං භයං වේරං
ශෝකං ජාතිං උපද්‍රවං
හරන්තං පූජයන්තා නං
වන්දේ තං බෝධි මුත්තමං

# අනුමෝදනාව

කුසතුල දරා ලේ කිරි කර පෙවූ මවුනි
කැත කුණු ගොඩේ නිදි මරමින් කල් ගෙවුනි
මේ දුක දරන්නට සමතෙක් ලොව නොවුනි
ඔබ සෙවූ නිවන ගෞතම සසුනෙදි ලැබුණි

දහඩිය හෙලා ඇති දැඩි කළ පියතුමනි
මවු ගුණ සේම පිය ගුණයට හිතනැමුනි
හොඳ මිනිසෙකු කරන්නට නිති වෙහෙසවුනි
මේ මහ කුසල් ගඟ ඔබටයි පියාණනි

මවු පිය දෙපලටයි ආසිරි පතන්නේ
ඔබ ණය ගෙවන්නට මඟකුයි සොයන්නේ
අටමහ කුසල් සාගරයයි බෙදන්නේ
මේ බුදු සසුනෙදිම සැනසුම ලබන්නේ

මව් පිය දෙපළටම ආසිරි ගෙනාවා
දිගාසිරි සුවය සහනය ලැබේවා
සසරේ මව්පියන් මේ පින ලබාවා
බිය කරු සසර සැඩ පහරින් මිදේවා

ඉපදෙන මැරෙන සංසාරෙට සමුදෙන්න
සම්බුදු රජුන්ගේ වචනය පිළිගන්න
මම මගේ කියන දේවල් අත හැර ලන්න
සැනසුන් මඟ එයයි නිවනින් සැනසෙන්න

මව්ගුණ දන්න අය ලෝකයෙ බිහි කරමු
පියගුණ දන්න අය ලෝකයෙ වැඩි කරමු
කලගුණ දන්න අය කලගුණ සිහි කරමු
මව් පිය ගුණය දැක ගථාවෙන් වදිමු

දසමාසේ උරේ කත්වා
පෝසේසි උද්දි කාරනං
ආයු දීගං වස්ස සතං
මාතු පාදං නමා මහං

උද්දිකාරෝ ආලිංගිත්වා
තුම්බිත්වා පිය පුත්තකං
රාජ මජ්ජං සුප තිට්ටං
පිතු පාදං නමා මහං

සිප් සත කියාදුන් ගුරු මව් පිය තුමනී
ඔබ කල සේවයට අපමණ ණය ගැතිනී
යහමග යවන්නට නිති ඔවදන් දුන්නි
දිගාසිරි පතන්නට සිහියට නැගුණි

බොරුවෙන් මුලාවෙන් ලොව රැවටී ඇත්තේ
නුවනැස පාදන්න වෙර වීරිය ගත්තේ
මහ අසිරියකි සම්බුදු සසුනක ඇත්තේ
ගුරු මව් තුමනි අද මම බුදුහිමි පැත්තේ

සසුනට පිවිසෙන්න පෙර පිං මතු වූවා
සසරින් මිදෙන මග ගැන නිතරම කීවා
පැවිදි උතුමන්ට උපහාරය වේවා
ඔබ සැම පුදන්නට අවසර ලැබ දේවා

බුදු සසුනක් තුලයි පිංකම් කරන්නේ
සුළු පටු නොවේ මහ අනුහස් ලබන්නේ
අටමහ කුසල් සතුටින්මයි පුදන්නේ
අනුමෝදන් කරමි මේ පිං ලබන්නේ

යහමග කියා දුන් ගුරු දෙගුරුන් වදිමු
කලගුණ සැලකීම නිතරම සිහි කරමු
තුන්ලෝ තිලක ගුරු සිහිකර සෙත් පතමු
ගාථා නද දෙමින් අනුමෝදන් කරමු

ඕකාස වන්දාමි භන්තේ
මයා කථං පුඤ්ඤං, සාමිනා අනුමෝදි තබ්බං
සාමිනා කථං පුඤ්ඤං, මයිහං දාතබ්බං,
සාදු සාදු අනුමෝදාමී
ඕකාස ද්වාරත්තේන
කථං සබ්බං අච්චයං ඛමථ මේ භන්තේ
ඕකාස කමාමි භන්තේ
දුතියම්පි ඕකාස කමාමි භන්තේ
තතියම්පි ඕකාස කමාමි භන්තේ

රට දැය සමය වෙනුවෙන් ජීවිත පිදූවා
හමුදා පොලිස් රණ විරුවන් සිහි වූවා
ඔබ කල සේවයට උපහාරය වේවා
මේ මහ කුසල් සැම අනුමෝදන් වේවා

ජනපතිගේ පටන් සියළුම මැති දැහැමී
සේවය අගයමින් උපහාරය පුදමී
රට දැය සමය ආගම දිවියෙන් රකිමී
සැමටම එක ලෙසින් අනුමෝදන් කරමී

බැතිබර හැඟීමෙන් ලොකු වෙහෙසක් දරමී
දායක කාර කාදී සැම සිහි කරමී
මහ සඟ රුවන වෙත කැපදරුදේ පුදමී
ඔබ සැමටත් මහා කුසලය හිමි කරමී

සම්බුදු අසිරියෙන් තුන්ලොව දිලෙන්නේ
සිරි සඳහම් නිසයි භව දුන් නිවෙන්නේ
මහ සඟ නිවන් මග පැහැදිලි කරන්නේ
මේ මහ කුසල් සඟ රුවනට පුදන්නේ

දෙවියන් බබුන් මහ පිරිසක් මෙහි ආවා
සත්බුදු වන්දනාවට ආසිරි පෑවා
සතුටින් යුතුව මල් වරුෂා වෙන් නෑවා
සියළුම දෙවි බබුන් අනුමෝදන් වේවා

මහ එල ලැබූ අපමණ දෙවියෝ වූවා
සක්දෙවි සිව් වරම් දෙවි පිං ලබාවා
අධිපති සියළු දෙවියන්ටත් ලැබේවා
දස අත සියළු දෙවි බබුනට පිදේවා

තිස් තුන් කෝටියක් දෙවියෝ වඩීවා
සියලුම දේව මංඩල වෙත යැවේවා
දෙවි දේවතාවෝ මේ පිං ලබාවා
සසරින් එතෙර වෙන ලෝසත රකීවා

සිවු මහ පරිස බුදු සසුනේ සිටීවා
සත්පුරුෂයයෝ සඳහම් මග රකීවා
පැහැදුණු සිත් ඇතිව සතුටින් වෙසේවා
ගුණයට ශීලයට දෙවියන් වදීවා

මේ මහ පිංකමේ කුසලය සිහි කරමු
දෙවි මහ බබුන් වෙත අනුමෝදන් කරමු
උඩ යට හසර දස අත මෙත් සිත යවමු
ගාථා නද දෙමින් අනුමෝදන් කරමු

ආකාසට්ඨා ච භුම්මට්ඨා
දේවා නා ගා මහිද්ධිගා
පුඤ්ඤං තං අනුමෝදිත්වා
චිරං රක්කං තු තං සදා

සතර අපා සතුනට මෙත් සිත යවමු
දස අත සියළු සතුන්ට සහනය පතමු
භවාග්‍රහ පටන් අවිචිය සිහි කරමු
මේ කුසලය සැමට අනුමෝදන් කරමු

එත්තා ව තාච අම්හේ හී
සම්බ තං පුඤ්ඤ සම්පදං
සබ්බේ දේවා අනුමෝදන්තු
සබ්බේ භූතා අනුමෝදන්තු
සබ්බේ සත්ථා අනුමෝදන්තු
සබ්බේ ඤාති පේථා අනුමෝදන්තු
සබ්බ සං පත්ති සිද්ධියා

මව්පිය සහෝදර ගුරු භවතුන් වේවා
අඹු සැමි ඤාති දූ දරුවන් සිහි වේවා
සසරේ අප නමින් මියගිය අය වූවා
නිදුකින් සැනසෙන්න මේ පිං හිමි වේවා

මේ ලැබූ ජීවිතේ මිය ගිය අය සිතලා
සියලුම දෙනා තම නුවනින් සිහි කරලා
අනුකම්පා සිතින් කලගුණ සිහි කරලා
අපමන පිං බලෙන් සැම සුවපත් කරලා

මෙත් කරුණා සිතින් යුතුවම පතුරවමු
දස අත අනන්තය තෙක් සිත විහිදුවමු
මම මගෙ කිවූ පිරිස අපමන බව දකිමු
ගාථා නාදයෙන් අනුමෝදන් කරමු

ඉදං මේ ඤාතීනං හෝතු
සුඛිතා හොන්තු ඤාතියෝ ///

අති දුර්ලභව මේ මිනිසත් බව ලැබුවේ
සම්බුදු මුවින් මයි මේ දම් පද දෙසුවේ
නම් කලණ මිතු ඇසුර ක්ෂණ සම්පත ලැබුවේ
සසරින් මිදෙන්නට ඇගියි තව කල් මැරුවේ

අනියත දහම නිතරම සිහි කර ගන්න
අටලෝ දහම තුල කටයුතු කර ගන්න
අසත් පුරුෂ බාලායො දුරු කර ගන්න
ප්‍රතිපත්තිය තුලින් නිවනට බැස ගන්න

දුක් පීඩා මැදින් බාධක ජය ගනිමු
මේ මහ කුසල් නිවනට නතු කර ගනිමු
සම්බුදු සසුන තුල සැනසුම ලැබ ගනිමු
ගාථා නද දෙමින් අම නිවනටම පතමු

ඉමිනා පුඤ්ඤ කම්මේන
මාමේ බාල සාමාගමෝ
සතං සමාග මෝහෝතු
යාව නිබ්බාණ පත්තියා

ඉදං මේ පුඤ්ඤං, ආසවක්කයා වහං හෝතු
සබ්බ දුක්ඛා පමුඤ්ඤතු

තුන් ලෝ තිලක සත්බුදු හිමියන් ගාවා
සත්බුදු රජානන් ගෙන් අවසර වේවා
සඳහම් සඟ රුවන අවසර ගෙන දේවා
සුළු යම් දෝෂයක් උව අවසර පෑවා

සිත කය වචනයද සංවර වයි ඉන්නේ
සසර ගතියටම හිත ඇදිලා යන්නේ
පොඩි වරදක් උවද අවසර ගෙන දෙන්නේ
නිවනින් සැනසෙන්න මයි වීරිය ගන්නේ

බෝ රජු ගෙන්ද අවසර ඉල්ලා සිටිමු
බුදු දම් සඟුන් තෙරුවන් අවසර ගනිමු
ආශිර්වාද පිංකම දන් නිම කරමු
ගාථා නද දෙමින් ආයාචන කරමු

කායේන වාචා චිත්තේන
පමාදේන මයා කථං
අච්ච යං කමමේ භන්තේ
භූරි පඤ්ඤ තථාගත ///

අනන්ත සසර පටන්, මේ මොහොත දක්වා
බුදු රජාණනන් වහන්සේලාට
පසේ බුදු රජාණන් වහන්සේලාට
මහ රහතන් වහන්සේලාට
උතුම් වූ ත්‍රිවිධ රත්නයට
බෝ සමිඳුන් වහන්සේලාට
සිල්වත් ගුණවත් උතුමන්ට
මව්පිය ගුරුවර ආදී, දිව්‍ය මනුෂ්‍ය ආදී,
සියළුම සත්වයන්ට,
මා දන නොදන, සිදු වූ සියළු වරදට,
බුද්ධ රත්නයෙන්ද,
ධම්ම රත්නයෙන්ද,
සංඝ රත්නයෙන්ද,
මට සමාව ලැබේවා…///

දස දිසාවේ සකල ලෝක වාසී සියළුම සත්වයෝ,

වෛර නැත්තෝ වෙත්වා ...!
තරහ නැත්තෝ වෙත්වා ...!
ඊර්ෂ්‍යායා නැත්තෝ වෙත්වා ...!
දුක්පීඩා නැත්තෝ වෙත්වා ...!
සුවසේ ජීවත් වෙත්වා ...!
සාන්ත සුවයට පත් වෙත්වා ...!
සාන්ත සුවයට පත් වෙත්වා ...!
සාන්ත සුවයට පත් වෙත්වා ...!

සාදු ......

සාදු ........

සාදු ........